සන්නස
SANNASA

දයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික, කාර්ය විභාග කොමසාරිස්

එළොව පොල් සහ දෙබිඩි පොල්

දැනට දශක පහකට පමණ ඉහතදී (70 දශකයේදී) ශ්‍රී ලංකාවේ පොල් වගාවට ඉතාමත් දරුණු කුරුමිණි වසංගතයක් නිසා මහත් පීඩාවක් ඇතිවිය. වසංගතය පොල් හෙක්ටෙයාර් අට දහසකට පමණ ඉක්මණින්ම පැතිර ගියේය. මෙම වසංගතයට මූලික වූයේ Promecotheca cumingi නමැති කෘමි පලිබෝධයෙක් විය. පොල් පර්යේෂණ ආයතනයේ නිලධාරීන්ගේ බලවත් උත්සාහය නිසාම ජෛව පාලන ක්‍රමවේදයක් මගින් කෘමි උවදුර පහසුවෙන් මැඩ පැවැත්වීමට හැකිවිය. මෙම ජෛව පාලන ක්‍රමවේදයට සමාන පිළියමක් 1930 දී පමණ පිලිපීනයේ එවැනිම පොල් කුරුමිණි උවදුරක් සඳහා සාර්ථකව අත්හදා බලා තිබුණි.

පලිබෝධ සහ ජෛව පාලන ක්‍රමවේද, අපොස උසස් පෙළ ජීව විද්‍යාව විෂයයේ, වැදගත් ඒකකයක් විය. උසස් පෙළ සිසුන් සඳහා පලිබෝධ සහ ජෛව පාලන ක්‍රමවේද පිළිබඳ වැඩමුලුවක් සඳහා සුදුසු දේශකයෙකු සොයා දෙන ලෙස ජීව විද්‍යාව උගන්වන ගුරු පිරිසක්, විද්‍යා අධ්‍යාපන නිලධාරිවරයා වූ මගෙන් ඉල්ලා සිටියහ. වසර කිහිපයකට ඉහතදී මේ සම්බන්ධව පර්යේෂණ කළ මගේ හිතවත් නිලධාරියෙකුගෙන් මේ පිළිබඳව විමසීමි. ඔහු ඒ සඳහා කැමැත්ත පළ කළේය. මා විසින් සැලසුම් කර ප්‍රදේශයේ මධ්‍ය විද්‍යාලයේ පිහිටුවන ලද ක්ෂෙත්‍ර අධ්‍යයන මධ්‍යස්ථානයේ වැඩමුළුව පැවැත්වීමට සූදා නම් කරන ලදී. එම යෝජිත කාර්ය සැසිය

සීෂෙල්ස් දූපත් පිහිටීම, මැඩගස්කරයට ඊසාන දෙසින්

මෙහෙයවන ලෙසද මට ඇරයුමක් ලැබිණ. විෂයය පිළිබඳ දේශණය සඳහා පැය එකහ මාරක් පමණ වෙන්කර තිබුණත්, තවත් පැය කිහිපයක් ඒකකයට අදාළ වෙනත් ගැටළුද සාකච්ඡා කිරීමට දේශකයා විසින් කැමැත්ත පලකළ නිසා ඒ බවට ද සිසුන් දැනුවත් කර තිබිණ.

පොල් වලට බොහෝ දුරට සමාන "දෙබිඩි පොල්" පිළිබඳව පිරිස දැනුවත් කිරීමට මෙය හොඳම අවස්ථාවක් නිසා, එදින වැඩ සටහනට එයද ඇතුලත් කිරීමට මම යෝජනා කළෙමි. දෙබිඩි පොල් ස්වාභාවිකව වැවෙන රටක් වන, සීෂෙල්ස් දූපත් රාජ්‍ය යේ, කලක් සේවය කළ මාහට, තිළිණයක් ලෙස එම රජයෙන් ලැබුණු දෙබිඩි පොල් ගෙඩියක් මා සතුව තිබුණු බැවින්, එය එදින වැඩ මුළුව සඳහා ගෙන ඒමට හැකි බවද මම විදුහල්පති තුමාට කීවෙමි.
පලිබෝධ සහ පලිබෝධ නාශක ජෛව පාලන ක්‍රමවේද පිළිබඳ හරවත් දේශණය පැයකදී අවසන් විය. තවත් පැය භාගයක් පමණ විෂයයට අදාළ ගැටළු පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලදී.

මින් පසු විදුහල්පති තුමා මා හඳුන්වා දී, පොල් පලිබෝධ ගැන දැනුවත් වී සිටින පිරිසට එළොව පොල් පෙන්වීමට මා සූදා නමින් සිටින බව දැන්වීය. එම ප්‍රකාශය නිසා සියලු දෙනාම මහත් කුතුහලයකට පත්වී, අත්පොලසන් නාදයකින් මා පිළිගත්හ. "දෙබිඩි පොල්" එළොව පොල්ද?

එතෙක් බෑගයක දමා තිබුණු, සීෂෙල්ස්හිදී මට තෑගි ලැබුණු දෙබිඩි පොල් ගෙඩිය පිටතට ගෙන මේසය මත තැබීමි. එය දුටු සියල්ලෝම කුතුහලයකින් යුතුව නොඉවසිලිමත්ව එබිකම් කිරීමට පටන් ගත්හ. එය යන්තමින් දැකගත්, ගුරු සිසු දෙපක්ෂයේම මුහුණු අමුතු වනු මම දුටුවෙමි. එකිනෙකා පහත් ස්වරයෙන් යම් යම් දේ මිමිණුවා මිස, කිසිවෙකු යමක් ප්‍රකාශ කළේ නැත.

පිරිසට ස්තුති කළ මා, දෙබිඩි පොල් ගැන සුළු හැඳින්වීමක් කර, කාටත් එය හොඳින් නිරීක්ෂණය කළ හැකි වන පරිදි අතින් අත යැවීමි. කාලය සීමිත නිසා මට විනාඩි තිහකින් පමණ විස්තරය නිම කිරීමට සිදුවිය. දෙබිඩි පොල් පිළිබඳ පහත සඳහන් වැදගත් කරුණු මම ඔවුනට පැහැදිලි කර දුනිමි.

රූප සටහන් සහ පෝස්ටර් කිහිපයක්ද සහිතව මගේ විස්තර කිරීම කළෙමි. (එකල පාසල්වල වීඩියෝ, පවර් පොයින්ට් ප්‍රොජෙක්ටර් වැනි ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ නොවිය)

මා කළ විස්තරය සැකෙවින් මෙසේය

1. තාල වර්ගයේ ගසක් වන, සාමාන්‍ය පොල් ගසකට වඩා විශාල දෙබිඩි පොල් ගසෙහි උද්භිද විද්‍යාත්මක නාමය Lodoicia maldivica වේ. මෙය පොදු ව්‍යවහාරයේදී double coconut යන නමින් හැඳින්වේ.
2. මෙය ඉන්දියන් සාගරයේ දකුණු දිගින් පිහිටි සීෂෙල්ස් දූපත් සමූහයේ ඇති ප්‍රාලේ (Praslin) නම් කුඩා දූපතට ආවේණික ඒක දේශීය ශාකයකි.
3. මෙහි ඵලය (ගෙඩිය) ලොව තිබෙන විශාලතම ශාක ඵලයයි.
4. ශත වර්ෂ ගණනාවක් තිස්සේ මුහුදේ පාවී තිබෙනු දැක ඇති මෙම බීජය නැගෙනහිර අප්‍රිකානු වෙරළ තීරයේත්, ඉන්දියන් සාගරයේ තවත් සමහර රටවල වෙරළේත් වරින් වර හමුවී ඇත.

ජායා ශාකයක 'දෙබිඩි පොල්' ගෙඩි සහිත වල්ල.

5. එහෙත් එම අද්භූත වස්තුව එනු ලබන්නේ කොහි සිටදෝ යන්න නොදත් නිසා, එය මහ මුහුද පතුලේ තිබෙන, අදෘශ්‍යමාන දේව බලයක් සහිත විශ්මිත ගසක ගෙඩියක් යයි විශ්වාසයක් පැවතුණි.
6. පිහිටීම පිළිබඳ සත්‍ය තොරතුරු තහවුරු නොකළ එම නිගමනය මත, මුලින්ම එය ප්‍රං.ශ බසින් කොකෝ ඩෙ මේ Coco de mer (මුහුදෙන් ආ පොල්) යනුවෙන් නම් කර තිබේ.
7. මුල් අවදියේදී මාලදිවයින් අවට මුහුදේ තිබී කිහිප වරක්ම සොයා ගනු ලැබූ නිසා එයට Maldivian coconut යන නාමයද භාවිත විය.
8. දහඅටවන සියවස මුලදී දේශගවේශක යින් විසින් සීෂෙල්ස් දූපත් සොයා ගනු ලැබීමෙන් පසුව දෙබිඩි පොල් ගස් එම දූපත්වල තිබෙන බව අනාවරණය විය. සීෂෙල්ස්හි, ප්‍රාලේ දූපතෙහි, දෙබිඩි පොල් ප්‍රමුඛ ශාකය ලෙස ඇති, අක්කර 100 ක පමණ වනාන්තරයක් සොයාගෙන තිබේ. මෙය මුහුදෙන් මතුවූ නිම්නය (Valley de mai) ලෙස නම් කර තිබේ.

හැඟී ලැබුණු දෙබිඩි පොල්ගෙඩිය

9. එවකට ප්‍රංශයේ රජ කළ 15 වන ලුවී (Louis XV) රජුට ගෞරව කිරීමක් වශයෙන් මෙම අද්භූත ශාකය බලාදසජම් ලෙස නම් කරන ලදී. (Louis යන නමෙහි ලතින් යෙදුම Lodoicus වේ.)
10. පසු කලකදී උද්භිද විද්‍යාඥයින් විසින් එය, මාලදිවයින් වල මුලින්ම හමුවූ නිසා, ද්විපද නාමකරණය අනුව Lodoicia maldivica ලෙස නම් කරන ලදී.
11. සීෂෙල්ස්හි බහු තාක්ෂණ ආයතනයේ සේවය කරද්දී (1985 වර්ෂයේදී), විද්‍යා සිසුන් පිරිසක් සමග මෙම දූපතෙහි පරිසර අධ්‍යයනයක් කිරීමට මට අවස්ථාව ලැබිණ.
12. දෙබිඩි පොල් වනාන්තරය සොයාගනු ලැබුවාට පසු එම දිවයින් වලට ගෞරවයක් වශයෙන් ශාකයේ උද්භිද විද්‍යාත්මක නාමය සමහර අවස්ථාවලදී Lodoicia maldivica (seychellarum) කියාද යොදා ගෙන තිබේ.
13. පොල් ගසකට වඩා බෙහෙවින් විශාල ද්විරූපී දෙබිඩි පොල් වල, පුං ශාක (male plant) සහ ජායා ශාක (female plant) වෙන වෙනම තිබේ.
14. වෙන වෙනම ඇති ශාකවල හටගන්නා පුං සහ ජායා පුෂ්ප පරාගණය වී සංසේචනය වීම සිදුවන්නේ කෙසේදැයි යන්න පිළිබඳ විද්‍යාත්මක තොරතුරු දුර්ලභය. (එම දූපත් වලට ආවේණික කොළ පැහැති හූනෙක් වැනි කුඩා උරග විශේෂයක් මගින් මෙය සිදු කරනු ඇති බව දැන් විශ්වාස කෙරේ.)
15. ජායා ශාකයේ හටගන්නා දෙබිඩි පොල් ගෙඩිය (බීජය) ලෙල්ල ඉවත් කළ පසු, වැඩුණු කාන්තාවකගේ නග්න උකුල් ප්‍රදේශයේ හැඩහුරු කම පෙන්වයි.

පුං ශාකයේ පුෂ්ප මංජරිය

16. පුං ශාකයේ හටගන්නා පුෂ්ප මංජරියද බොහෝදුරට පුරුෂ ලිංගුවක හැඩය ගනී.
17. මෙම ආශ්චර්යමත් ව්‍යුහය නිසා, ආදම් සහ ඒව මෙම දිවයින් වල විසූ බව විශ්වාස කර, දේව කථා ආශ්‍රිතව මෙම දිවයින් පාරාදීස දිවයින් (Islands of Paradise) යන අන්වර්ථ නාමයෙන්ද හැඳින්වේ.
18. ආදම් සහ ඒව තම ආත්මයේ ජෛව සංකේත මෙම ශාක වලට ආරූඪ කර ඇති බව දිවයින් වැසියෝ තරයේ විශ්වාස කරති.
19. කෙසේ හෝ මෙම ශාකවල පුෂ්ප පරාගණය පිළිබඳවද දේව කතාවක් නිර්මාණය වී තිබේ. එයට අනුව පුන්සඳ පායා, අහසේ තරු බැබලෙමින්, මන්ද මාරුතයද තිබෙන දිනවල රාත්‍රී කාලයේදී පුං සහ ජායා ශාක දේව අනුහසින් නැමී ආලිංගනය කරගන්නා බවත්, එය හේතු කොටගෙන පුෂ්ප පරාගණය වී සංසේචනයෙන් පසු ගෙඩි හටගන්නා බවටද විශ්වාසයක් පවතී.
20. සීෂෙල්ස් රටෙන් ශ්‍රී ලංකාවට ලැබුණු දෙබිඩි පොල් පැළයක් පේරාදෙණිය උද්භිද උයනේ රෝපණය කර, සරුවට වැඩී ඇත.
21. දෙබිඩි පොල් වලට සමස්ත ලෝකයේ, උද්භිද විද්‍යා වාර්තා, පහත් තැබීමට හැකිවී තිබේ. ඒවා මෙසේය
- බරෙන් වැඩිම ශාක ඵලය (උපරිමය 42 Kg)
- දිගම බීජපත්‍රය (ජද්වභකඨාදබ) හටගැනීම (උපරිම දිග 4 m)
- විශාලතම සංයුක්ත පත්‍රය (වෘන්තය පමණක් 3 m පමණ දිග)
- තාලවර්ගයේ ගසක විශාලතම පුෂ්ප මංජරි
- දිරායන පත්‍ර වලින් පෝෂක කොටස් ඉතා කාර්යක්ෂම ලෙස ආපසු ශාකයට ලබාගැනීම

කාලය සීමා වූ නිසා මට සිසුන් සමග කතාබස් කළ හැකිවූයේ ඉහත දැක්වෙන තොරතුරු පමණකි.

16 වන පිටුව